SLGURU.LK

# කලාප අධ්‍යාපන කාර්යාලය කොළඹ - ශ්‍රී ජයවර්ධනපුර
## வலயக் கல்வி காரியாலயம் கொழும்பு – ஸ்ரீ ஜயவர்தனபுரம்
## Zonal Education Office Colombo - Sri Jayawardhanapura

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2025**
**Second Term Test - 2025**

**සිංහල භාෂාව හා සාහිත්‍යය I** | **11 ශ්‍රේණිය** | **කාලය පැය එකයි**

නම..............................................................

I. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
II. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
III. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවලට එක් එක් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

1. "මාව **මුරුංගා අත්තේ** තියන්න එපා" යැයි ආයතන ප්‍රධානියා කාර්ය මණ්ඩල රැස්වීමේ දී ප්‍රකාශ කළේ ය.
   1) ආඩම්බරයට පත් කිරීම  2) ලජ්ජාවට පත් කිරීම
   3) බොරු වර්ණනාවලින් සතුටු කිරීම  4) සැබෑ තත්ත්වය පෙන්වා දීම

2. දේශපාලනඥයින්ට **කත් අදින** රාජ්‍ය නිලධාරීන් රටට ම අවාසනාවකි.
   1) අනවශ්‍ය පක්ෂපාතිකම් පෙන්වීම  2) බර උසුලාගෙන යාම
   3) කැඟි බෝග ගෙන යාම  4) රාජකාරිය පැහැර හැරීම

3. "සිරිදාස මාමාත් **නොඑන ගමන් ගියා**" යැයි ජයසිංහ පැවසීය.
   1) අමනාප වී ගියා  2) මිය පරලොව ගියා
   3) සුසාන භූමියට ගියා  4) දුර බැහැරක ගියා

- අංක 4 සිට 6 දක්වා ඇති ප්‍රශ්නවල හිස් තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. අමාත්‍යවරයා විසින් ලෝක කම්කරු ........................ අවශ්‍යතාව කම්කරු දිනය දා අවධාරණය කෙරිණි.
   1) රෙගුලාසියක  2) ප්‍රඥප්තියක
   3) සංග්‍රහයක  4) කෘතියක

5. පැරණි සම්භාව්‍ය ගද්‍ය කෘති ඇසුරින් මිශ්‍ර සිංහල ලේඛන .................ක් වෙත යොමු වන්නට දැරූ උත්සාහය පුවත්පත් ලිපිවලින් ප්‍රකට වේ.
   1) ආඛ්‍යානය  2) වාරණය
   3) රචනය  4) ශෛලිය

6. ශ්‍රී ලාංකිකයා පරාධීනත්වයෙන් මුදවා ගැනීමේ ..................... එස්. මහින්ද හිමියන් කළ නිර්මාණ බොහෝ ය.
   1) පරමානන්දයෙන්  2) පරමාභිලාෂයෙන්
   3) ආත්මාර්ථයෙන්  4) පරමාර්ථයෙන්



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

7. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පෙළිය තෝරන්න.
   1) දලඹුවා, අධිෂ්ඨාන, පළිබෝධක, කෘෂ්ණාව
   2) ප්‍රස්තාර, ලේඛනය, ක්ෂීරපථය, උත්කෘෂ්ට
   3) අන්වේෂණ, කෝෂ්ඨාගාර, අරුණලු, කිලිටි
   4) වංශය, සෞභාග්‍යය, ආස්තරණ, සෝභාව

8. පහත දී ඇති වචනවල පළමු අකුරෙහි පිළිවෙළින් පාපිල්ල, ඇදපිල්ල, ගැට ඇලපිල්ල හා රකාරාංශය සහිත වරණය තෝරන්න.
   1) මෘදු, සායම, පත්‍රය, කැරලා
   2) සාමය, කැවුම, පෘථිවිය, ප්‍රවෘත්ති
   3) ශූර, බැවුම, ධර්මය, සීලය
   4) පුටුව, රෑහැන, කෘත්‍රිම, ව්‍රතය

9. පහත අක්ෂර වර්ගීකරණ නාමයන් නිවැරදි ව අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
   ශ, ෂ, ස, හ ____ ය, ර, ල, ව ____ භ, ජ, ඩ, ඳ, ඹ ____ බ, ඨ, ධ, භ

   1) අන්තඃස්ථ අක්ෂර, මහාප්‍රාණ අක්ෂර, සඤ්ඤක අක්ෂර, ඌෂ්මාක්ෂර
   2) මහාප්‍රාණ අක්ෂර, සඤ්ඤක අක්ෂර, අන්තඃස්ථ අක්ෂර, ඌෂ්මාක්ෂර
   3) ඌෂ්මාක්ෂර, අන්තඃස්ථ අක්ෂර, සඤ්ඤක අක්ෂර, මහාප්‍රාණ අක්ෂර
   4) ඌෂ්මාක්ෂර, සඤ්ඤක අක්ෂර, මහාප්‍රාණ අක්ෂර, අන්තඃස්ථ අක්ෂර

10. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පෙළිය තෝරන්න.
   1) කලියුගය, ගම්පෙරළිය, පූජාවලිය, මඩොල්දූව
   2) මිනුවන්ගොඩ, මාතලේ, රුවන්වැල්ල, රත්නපුර
   3) ගජබා, දුටුගැමුණු, ධාතුසේන, වළගම්බා
   4) මයූරපාද, සුනේත්‍රාදේවී, විජයබා, පද්මාවතී

11. අනුක්ත පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
   1) මා, ඔවුන්, මිනිසෙක්, දූවක්
   2) ඔවුහු, කෙකිණියක, දෙවියෙක්, අප
   3) ගොවියන්, මීයෙකු, නිළියක, තොප
   4) තා, දරුවෙකු, ගංගාවෝ, විද්වත්හු

12. පහත වාක්‍යයේ යටින් ඉරි ඇඳි පදයේ විභක්තිය නිවැරදි ව දක්වා ඇති වරණය තෝරන්න.
   භික්ෂූහු දන් <u>**පිණිස**</u> පිඩු සිඟා වැඩියහ.
   1) අවධි විභක්තිය
   2) කරණ විභක්තිය
   3) කර්ම විභක්තිය
   4) සම්ප්‍රදාන විභක්තිය

13. අන්‍යාර්ථ සමාසයකට උදාහරණයක් වන්නේ,
   1) රන්පිදි
   2) දිගැසි
   3) නිල් මහනෙල්
   4) කිරිබත්

14. තද්ධිතයක් නොවන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
   1) සාමාජික, ගැමියා, ඉසුරුමත්, අරටු
   2) මුහුලස්, නාගරික, කොටියා, විදේශීය
   3) පුරාතන, නැටිලි, දේශීය, නැණවත්
   4) ශ්‍රේෂ්ඨතම, නිහඬතා, සිනාසෙන්නෝ, ස්වර්ණමය

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.
   1) උපසර්ග - අබිමන්, අවමංගල, දුසිරිත්, ප්‍රතිලාභ
   2) නිපාත - විතර, සෙද, බඳු, යළි
   3) කෘදන්ත නාම - කියුම්, රකින්නා, කියන්නී, රකිම්
   4) අසම්භාව්‍ය ක්‍රියා - කැවොත්, කළොත්, කියත, ලියද්දී



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

16. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා අනුපිළිවෙලින් ඇති පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
   1) කඩා, බලව, නටන, කරමින්
   2) එද්දී, කපා, නරඹමින්, අසනු
   3) සරසමින්, ගයා, කියගං, නැවුවොත්
   4) වසා, අඩ අඩා, කියද්දී, නරඹ

- අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. මේ **අසෙව** වැදහොත් වඳුරා මරා මස් කොට අනුභව කිරීමෙන් ශරීරයත් පුෂ්ටිකොට ගෙන, මෙයින් මාර්ගෝපකරණයකුත් සපයා ගනිමි.
   1) සතුටට පත් ව
   2) දුකට පත් ව
   3) වෙහෙසට පත් ව
   4) බියට පත් ව

18) ඇගේ රන්වන් මුව කුඩා ය, **ජපා පුෂ්පයක්** බඳු ය.
   1) ජපන් කුසුමක්
   2) සුදු නෙළුම් මලක්
   3) මහනෙල් මලක්
   4) රෝස මලක්

19. භාෂාව හා සංස්කෘතිය අතර ඇත්තේ **අවියෝජනීය** සම්බන්ධතාවකි.
   1) වෙන් කළ නොහැකි
   2) එකිනෙකට පරස්පර
   3) වෙනස් විය හැකි
   4) උරුමයෙන් ආ

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී නොපවත්නා පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
   1) වාක්‍යය, ඡේදය, පරිච්ඡේදය, පුස්තකය
   2) ජලාශය, වේල්ල, ඇළ, කුඹුර
   3) සතුට, ප්‍රීතිය, හෘදය, සොම්නස
   4) කුරුඳුපොතු, කරපිංචා, එනසාල්, කරාබුනැටි

21. එක් එක් පද පේළියෙහි දක්වා ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
   1) භූමිය - පොළොව, මුහුද - සයුර, දිනකර - සිසි, පවන - නල
   2) අභන - කත, අචල - චංචල, මුග්ධ - නැණවත්, මින්දද - විහඟ
   3) අශ්වයා - තුරඟ, අග්නි - ගින්න, දිනිති - සිඟිති, ආධුනික - ප්‍රවීණ
   4) සම්මුතිය - එකඟතාව, විලිකුන් - ඉඳුණු, උදාසීන - අලස, වනය - බැද්ද

22. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
   1) පාෂාණ, ශිලා, ශෛල, පහණ
   2) චන්ද්‍ර, උළිඳු, තාරපති, සිසි
   3) කත, ලිය, මව, වනිතාව
   4) පද්ම, තඹරු, පියුම, අරවින්ද

23. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
   1) වහල් - නිවහල්
   2) ආගමන - විගමන
   3) නිශ්ඵල - සඵල
   4) සංයෝජන - යෝජන

24. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
   1) යුගල පද යනු භාෂාවේ යෙදෙන සාම්ප්‍රදායික යෙදුම් විශේෂයෙකි.
   2) ක්‍රියා මූලයට ප්‍රත්‍ය එක් වීමෙන් තද්ධිත නාම සෑදේ.
   3) ප්‍රකෘතියකින් පර ව අර්ථ බෙදා දැක්වීම සඳහා සංයෝග වන්නේ විභක්තිය යි.
   4) පද කිහිපයක් කැටි කොට එක් පදයක් බවට සකස් වූ පද සමාස නම් වේ.

25. 'මුරකරුවෝ සොරුන් පලවා හරිති.'
   යන වාක්‍යය කර්ම කාරකයට හැරවූ විට නිවැරදි පිළිතුර වන්නේ,
   1) මුරකරුවන් විසින් සොරු පලවා හැරිණි.
   2) මුරකරුවන් විසින් සොරුන් පලවා හැරේ.
   3) මුරකරුවන් විසින් සොරු පලවා හරිනු ලැබුහ.
   4) මරකරුවන් විසින් සොරු පලවා හැරෙති.

SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

- අංක 26, 27 ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ ඇතුළත් වරණය තෝරන්න.

26. විශාල බලාපොරොත්තුවක් ඇති ව සිටිය ද ප්‍රතිඵල අල්ප වීම.
    1) වඳින්න ගිය දේවාලේ ඉහේ කඩා වැටුණා වගේ
    2) දියකාවගේ පිටේ ලුණු හැංගුවා වගේ
    3) ආඩි හත්දෙනාගේ කැඳ හැළිය වගේ
    4) පුංචි අම්මත් ඇවිත් කැවුම් පුංචි කළා වගේ

27. අධමයන්ට උතුම් දෙයින් පලක් නැතිකම.
    1) කැලේට පායපු හඳ වගේ
    2) ඌරෝ කවදද කහ කැවේ
    3) මැණික් ගල පයේ හැපුණත් කණා ඇහිඳ ගනියි ද?
    4) හඳුන් වනෙත් ඇත උරලැවෝ

28. පහත දැක්වෙන සන්ධි පද නිවැරදි ව යෙදී ඇති වරණය තෝරන්න.
    1) හිතැති - ආගම සන්ධිය
    2) මැතිතුමා - පරස්වර ලෝප සන්ධිය
    3) දෑ අවුරුදු - ගාත්‍රාදේශ සන්ධිය
    4) ගම්පොළ - ද්විත්ව රූප සන්ධිය

- අංක 29, 30 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

29. 1) 'ගායිකාව ගීයක් ගයති'යි රසිකයන් අපේක්ෂා කළහ.
    2) නගරයේ සිඟන්නන් ඇත.
    3) රජවරු සහ රටවැසියන් රට ආරක්ෂා කළහ.
    4) කිරිල්ලියෝ පැටවුන් කැටුව කූඩුවට යති.

30. 1) තරුණ දරුවන් සමාජ මාධ්‍ය තුළින් අපේක්ෂා කරන්නේ මොනවා ද?
    2) මව් තොමෝ දරුවන් රැක බලා ගත්හ.
    3) මා එම චිත්‍රපටය නරඹා ඇත්තෙමි.
    4) අපි සමඟි ව වාසය කළ යුතු ය.

31. පහත දැක්වෙන (අ) සහ (ආ) කොටස් යටතේ දැක්වෙන වචන හා අර්ථ වඩාත් නිවැරදි ලෙස එකිනෙකට ගැළපෙන වරණය තෝරන්න.

| (අ) | (ආ) |
|---|---|
| A මාගමක් | ස්ත්‍රියක් |
| B ලඹ දෙන | ඵල හට ගන්නා |
| C කාව්‍යශේඛරය | රාහුල හිමි |
| D සිනා කුමරි | මහගම සේකර |

1) A හා B    2) B හා D    3) A හා C    4) C හා D

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමන වාක්‍යය ද?

    **මම විනෝද ගමනට එයි කියලා යාළුවෝ හිතුවා.**

    1) 'මා විනෝද චාරිකාවට සහභාගී වෙති'යි යහළුවෝ සිතූහ.
    2) 'මම විනෝද චාරිකාවට සහභාගී වෙයි' යහළුවෝ සිතූහ.
    3) මම විනෝද චාරිකාවට එතැයි යහළුවන් සිතුවේ ය.
    4) මා විනෝද චාරිකාවට සහභාගී වෙතැයි යහළුවන් සිතූහ.

33. රූපකයක් සහිත වරණය තෝරන්න.
    1) මී දේ දුව ඉසට නැඟුව ඉඳුනිල් මිණි සේසතක් ය.
    2) අඹ ඇට ලාසක් පුපුරන ලෙසිනි.
    3) කුඹුයොත් සයුරු බොත එහි මිණි සේ අනත
    4) එක් රූපිකාවක් මල් දම් යුවලකට බඳු වූ කෝමල දෑත් මගේ ගෙල වටා යවා, තවත් මල් දමක් මගේ කර පැලැන්දුවා ය.



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

34) **කවිසිළුමිණ, සුභේත්‍රා, අසන් පත්තිනි දේවතාවී, හුණුවටයේ කතාව** යන කෘතිවල කතුවරුන් නිවැරදි අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

1) ඩබ්ලියු. ඒ. සිල්වා, මොණිකා රුවන්පතිරණ, හෙන්රි ජයසේන, II වන පරාක්‍රමබාහු
2) මොණිකා රුවන්පතිරණ, II වන පරාක්‍රමබාහු, ඩබ්ලියු. ඒ. සිල්වා, හෙන්රි ජයසේන
3) හෙන්රි ජයසේන, ඩබ්ලියු. ඒ. සිල්වා, මොණිකා රුවන්පතිරණ, II වන පරාක්‍රමබාහු
4) II වන පරාක්‍රමබාහු, ඩබ්ලියු. ඒ. සිල්වා, මොණිකා රුවන්පතිරණ, හෙන්රි ජයසේන

35. අක්ෂර නිවැරදි ව ගැළපීමෙන් ග්‍රන්ථ නාමයක් නිර්මාණය වන්නේ පහත සඳහන් කුමන වරණයේ ද?

1) ලා, ළ, නි, ව, තු, වැ, ය
2) ත්‍රා, සු, ර, ය, නේ
3) සි, මි, ව, ළු, ණ, ක
4) ජා, ව, පූ, ය, ලි, ස

36. පහත සඳහන් කවියෙහි සිව් වන පදය තෝරන්න.

මහවැලි කළු කැලණි වළවේ අත් හතරක් ඇති ලංකා
සමනොල කිරිගල් පිදුරුතලා ඈ කෙහෙ ගැට බැඳි ලංකා
තේ වතු පොල් වතු කෙත් වතු පෙළ උකුළේ නළවන ලංකා
.............................................................................

1) ඔබ හට අත පොවනට උත් මුන් හට ඉඩ නො[illegible]බමු ලංකා
2) බලි තරු රාවණ ගැමුණු විජයබා නිරිඳුන් ල[illegible] ලංකා
3) මුහුදින් අහලක් ඔබ වැවෙතොත් එහි පනිමූ [illegible]මු ලංකා
4) විදූ සක්විති මහ පැරකුම් කිව් ක[illegible] ලංකා

37. **අක්ෂි, ශ්වේත** යන්නට ගැළපෙන තද්භව යෙදුම් වන්නේ,

1) ඇස්, සුදු
2) චක්ෂු, ධවල
3) සුදු, ධවල
4) ඇස්, චක්ෂු

38. උඩරට උපභාෂාවට අනුව, **කෝලම්කාරයා** ලෙස හඳුන්වන්නේ,

1) මහල් කපුවා
2) පිරිමි ළමයා
3) අලි අල්ලන පුද්ගලයා
4) මී හරකා

39. "ඒ සැළිය ගෙන වැව බඳිනා තැනට ගොස් රජු සිටිනා තැන තැබුවේ ය. ළඟ සිටි කුමාරයා සැළියේ කඩවැස්ම මුදවා, මතුපිට තිබූ විස පෙවූ අඹය කමින් එවෙලේ ම නැසුණේ ය."

ඉහත පාඨය ඇතුළත් වන කෘතිය කුමක් ද?

1) බුත්සරණ
2) අමාවතුර
3) රාජාවලිය
4) සද්ධර්මරත්නාකරය

40. **"අවුරුදු දෙසියයක් ජීවත් වීමෙන් ලැබිය නොහැකි අත්දැකීමක්, මානව චරිතය පිළිබඳ දැනුමටත් තැන්පත් නුවණටත් වැඩි අත්දැකීමක් ජාතක පොත උගැන්මෙන් ලැබියි හැකි"** යැයි මාර්ටින් වික්‍රමසිංහ මහතා පවසයි.

ඉහත ප්‍රකාශයේ අදහස නිවැරදි ව දැක්වෙන වාක්‍යය තෝරන්න.

1) ජාතක පොත අධ්‍යයනය කිරීමෙන් පුද්ගල ජීවිතය සහ මානව චරිතයන් පිළිබඳ මෙතෙක් රැස් කර ගත් සියලු අත්දැකීම්වලට වඩා තියුණු අත්දැකීම් ලැබිය හැකි බව මාර්ටින් වික්‍රමසිංහ මහතා පවසයි.
2) අවුරුදු දෙසියයක් ජීවත් වීමෙන් ලබන අත්දැකීම්වලට වඩා වැඩි අත්දැකීම් ප්‍රමාණයක් ජාතක පොත තුළින් ලැබිය හැකි බව මාර්ටින් වික්‍රමසිංහ මහතා පවසයි.
3) මානව චරිතය පිළිබඳ අත්දැකීම් ජාතක කතා පොත තුළින් ලැබිය හැකි බව මාර්ටින් වික්‍රමසිංහ මහතා පවසයි.
4) ජාතක පොත කියවීම අවුරුදු දෙසියයක් ජීවත් වූවා හා සමාන බව මාර්ටින් වික්‍රමසිංහ මහතා පවසයි.

(ලකුණු 1 x 40 = 40යි)



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

# කලාප අධ්‍යාපන කාර්යාලය කොළඹ - ශ්‍රී ජයවර්ධනපුර
# வலயக் கல்வி காரியாலயம் கொழும்பு – ஸ்ரீ ஜயவர்தனபுரம்
# Zonal Education Office Colombo - Sri Jayawardhanapura

දෙවන වාර පරීක්ෂණය - 2025

இரண்டாம் தவணைப் பரீட்சை - 2025

Second Term Test - 2025

**සිංහල භාෂාව හා සාහිත්‍යය II** | **11 ශ්‍රේණිය** | **කාලය පැය දෙකයි**

නම..................................................................

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා ලකුණු 80ක් හිමි වේ.

---

01. අංක i සිට x තෙක් සියලු අනුකොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. පහත දැක්වෙන පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.

අ) වනය ආ) වණය

ii. පහත දැක්වෙන වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිවැරදි කර නැවත ලියන්න.

පුරාතන ශිෂ්ඨාචාරයට අනුව කුලීණ ජනතාව ජීවත් වූ බවට අවශේෂ හමු වී තිබේ.

iii. පහත සඳහන් පද නිවැරදි ව විසන්ධි කර ලියන්න.

අ) රත්මලාන ආ) හස්ත්‍යශ්ව

iv. පහත දැක්වෙන වාක්‍යයේ ඇති උපසර්ග සහිත පද දෙකක් තෝරා ලියන්න.

අවමංගල්‍යයට සහභාගී වූ ශිෂ්‍යයන් එදින ඉක්මනින් නිවසට පැමිණීම පිළිබඳ දෙමව්පියෝ සුපරීක්ෂාකාරී වූහ.

v. පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

අ) සොම්නස ආ) අවතීර්ණ

vi. පහත දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය ලියන්න.

අ) නළලට වැටෙන කෙස්රොද - ආ) දොරටුව මුර කරන්නා -

vii. පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.

අ) එදින රැස්වීමට දෙමව්පියෝ පාසලට පැමිණ නැත.

ආ) ගුරුවරු ශිෂ්‍යයෝ සමඟ චාරිකාව ගියහ.

viii. පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.

අ) කියත උන් මෙතෙපළ ආ) තබමින් පද තල අනුරු

ix. පහත දැක්වෙන යෙදුම්වල පළමුවැනි වචනය සමඟ දෙවන වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි හෝ දෙවැනි වචනය සකස් කොට ලියන්න.

අ) පුරාණ සිරිත් ආ) ජ්‍යේෂ්ඨ පුත්

x. පහත දැක්වෙන වාක්‍යයේ ඇති නිපාත පද දෙකක් තෝරා ලියන්න.

ශ්‍රී ලාංකීය දේශපාලන ව්‍යාපාරය තුළ සාධාරණ දේශයක් සඳහා ප්‍රතිපත්තිමය අනුරුවක් සමඟ ක්‍රියා පිළිවෙළක් අවශ්‍ය වේ.

(ලකුණු 2 x 10 = 20යි)



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

02. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

අ) තත්කාලීන ව රට තුළ උද්ගත ව පවත්නා මනුෂ්‍ය ඝාතන, ආගමික ගැටුම් ආදියට මූලික ම හේතුව වී ඇත්තේ අන්‍යෝන්‍ය අවබෝධය සහ අන්තර් සුහදතාව නොමැති වීම යි. රාජ්‍යයක අනාගතය යහපත් කිරීම සඳහා ආගම දහමට අනුව පාලනය ප්‍රධාන වන අතර සහජීවනය ද මූලික වේ. එමඟින් වූ ශ්‍රී ලාංකිය සමාජය ගැටුම් විරහිත, සාමකාමී රාජ්‍යයක් බවට පත් වේ.

ආ) වර්තමාන අධ්‍යාපන වපසරියත් සමඟ බොහෝ සිසුන් ජනප්‍රිය උපකාරක පන්ති කෙරෙහි යොමු වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. මේ සඳහා දරුවන්ගේ කාලය හා දෙමාපියන්ගේ මුදල් විශාල ලෙස වැය වන අතර දරුවන් උපකාරක පන්ති වෙත යොමු වීමට හේතු රාශියක් ද දක්නට ලැබේ. විධිමත් පාසල් අධ්‍යාපනයක් ලබා දීම මඟින් මේ සඳහා විසඳුම් සෙවිය හැකි ය.

ඉ) වත්මන් තාක්ෂණික විප්ලවයත් සමඟ අපේ පැරණි ජන සාහිත්‍යාංග සමාජයෙන් ඉවත් වී යන අයුරු දක්නට ලැබෙන අතර, ඒ වෙනුවට හරසුන් වෙළෙඳ ෆැන්ටසි සහ බටහිර ශෘංගාරාත්මක නිර්මාණ බාල, තරුණ, මහලු පරම්පරාවන් වැළඳ ගනිමින් සිටියි. එනමුත් කාලීන අවශ්‍යතාව වනුයේ සිත නිවන ආනන්දයෙන් ප්‍රඥාව කරා ගමන් කරන සාහිත්‍යයක අවශ්‍යතාව යි.

ඊ) ගෝලීය යුද පරිසරය සහ දේශපාලන විර්යාසය නිසා දියුණු වෙමින් පවතින තුන් වන ලෝකයේ රටවල් දැඩි ආර්ථික, සමාජ, දේශපාලනික අර්බුදයන්ට මැදි වී සිටියි. එයට විසඳුම වන්නේ රාජ්‍යයන් තනි තනි ව නැඟී සිටීමට අවශ්‍ය කුසලතා හා ආකල්පයන්ගෙන් පරිපූර්ණ වූ ශ්‍රම බලකායක් සමාජයට දායාද කිරීම යි. මේ සඳහා අධ්‍යාපන අංශය, රාජ්‍ය අංශය මෙන් ම පෞද්ගලික ව රටවැසියා ද උනන්දු විය යුතු ය.

(ලකුණු 25යි)

03. පහත දැක්වෙන ඡේදය වචන 65 - 75ත් අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වචන ගණන පිළිතුර අග ලියන්න.

නොයෙක් ආකාරයේ රාජ්‍යවලට බෙදුණු, විවිධ වර්ගයේ ආගම් හා දර්ශන අනුව සිතන පතන, විවිධ දේව සංකල්ප අනුව දෙවියන් හා දේවතාවුන් අදහන මෙන් ම දේවාල තනා, වාදනයෙන්, ගායනයෙන්, නැටුමෙන් යුක් යාග හෝම පවත්වන, විවිධ භාෂා කතා කරන, ඒ භාෂාවලින් ගද්‍ය පද්‍ය නිර්මාණ කරන, විවිධ ජාති-කුල-ගෝත්‍රවලට බෙදුණු, විවිධ සංස්කෘතීන් අනුව ජීවත් වන විශාල ජනගහනයකින් පිරුණු පැරණි භාරතය, විවිධත්වයෙන් පිරිපුන් දේශයකි. විවිධත්වයක් අසමානතාවත් සමඟ විරෝධාකල්ප ද ඇති වේ. මේ සියල්ල මිශ්‍ර වූ විට ඉන් අනුකූලතාවක් ද ඇති වේ. ඒවායේ අනුකූලතාවක් නොහොත් එකමුතුකමක් සමඟ රිද්මයක් උපදියි. හැම කලා නිර්මාණයක් ම සාර්ථක වන්නේත් ප්‍රේක්ෂකයින්ගේ සවන් පිනවන්නේත් නෙත් සිත් ආකර්ශනය කරන්නේත් අනුකූලතාවෙන් උපදින රිද්මය තුළිනි.

විවිධ හැඩහුරුකම් හා ශබ්දවලිවලින් යුත් අක්ෂර ගැළපීමෙන්, අදහස් පැවසිය හැකි භාෂාවක් නිර්මාණය වේ. ලෝකය අලංකාර තැනක් වී තිබෙන්නේ එහි පවත්නා විවිධත්වය, විරෝධතාව හා අනුකූලත්වය නිසා ය. තමා කැමැති ආගමක් ඇදහීමට, අදහස් නිදහස් ව හා නිර්භය ව පැවසීමට හා නිර්මාණ කාර්යයෙහි නිරත වීමට සමාජයේ පවත්නා විවිධත්වය අවහිරයකින් තොර ව පොළඹවන්නක් වෙයි. විවිධත්වය හා අනුකූලත්වය සෑම කලා නිර්මාණයක ම අවශ්‍යයෙන් ම තිබිය යුතු පොදු මූලධර්මයකි. මේ හේතුවෙන් විවිධත්වයේ හා අලංකාරයේ සංස්කෘතීන් පිහිටි රටවල් අතරින් ඉන්දියාවට ප්‍රමුඛත්වය හිමි වේ.

(ලකුණු 10යි)



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

04. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිංහල බෞද්ධ සාහිත්‍යයේ එන අග්‍රගණ්‍ය ම ප්‍රේම කතාව ලෙස කුස-පබාවතී පුවත දැක්විය හැකි ය. එහෙත් සම්මත දෘෂ්ටිවාදයෙන් අන්ධ වූවෝ කුස-පබාවතී පුවතට සදොස් අර්ථකථන ලබා දී ඇත. මේ සියල්ල ඉදුරා දක් එදිරිවීර සරච්චන්ද්‍ර මහතා උද්දාල හා ස්වර්ණලතා අතර දළු ලා වැඩී ගිය ස්ත්‍රී-පුරුෂ ප්‍රේමයේ නෙක දිශාවන් වෙත ප්‍රේක්ෂකයින් රැගෙන යාම උදෙසා "පේමතෝ ජායතී සෝකෝ" නාට්‍යය රචනා කරන ලදී. මෙහි දී උත්කර්ෂයට නගනුයේ සනාතන ප්‍රේමය පිළිබඳ සාර්වත්‍රික අගයක් වන නමුදු, ශෝකාන්තයක් ද මෙමගින් නිරූපණය කරනු ලබයි.

සම්මත සමාජ පවුර මත ගැටී, වැනසී ගිය ප්‍රේමයක ශෝකාන්තයක් වෙත අප රැගෙන යන නාට්‍යකරුවා, සියලු පාත්‍ර වර්ගයා පිළිබඳ හෘදයාංගම බවක් ප්‍රේක්ෂකයා තුළ ඇති කරවයි. ශෛලිගත සම්ප්‍රදායට අනුව රචනා කර ඇති මෙම නාට්‍ය වර්ගයේ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණය වනුයේ පරිසරය නිරූපණය කිරීමටත්, පාත්‍ර වර්ගයා හඳුන්වා දීමටත් නාට්‍යයට ආරම්භය හා අවසානය ලබා දීම ආදී කාර්යයන්ටත් පොතේගුරු හෙවත් සූත්‍රධර චරිතය නිර්මාණය කර තිබීම ය. නාට්‍යය තුළින් ප්‍රේක්ෂකයා වෙත ආරාධනය කරනු ලබන්නේ මානව සම්බන්ධතා වසා ගත් ඛේදවාචකයකට මැදි වන පුද්ගලයින් දෙස සානුකම්පිත දෘෂ්ටියක් හෙළීමට ය. "මනමේ", "සිංහබාහු" යන නාට්‍ය ද යොමු වන්නේ එම දිශානතිය වෙතට ය.

"මනමේ" සාම්ප්‍රදායික කතාව තුළ ගැබ් වනුයේ තම සැමියාට ද්‍රෝහී වීම නිසා විනාශයට පත් වූ කාන්තාවකගේ ශෝකාන්තය යි. පතිවත රැකීම ස්ත්‍රියකගේ මහත් වගකීමක් වුවත්, එය ස්ත්‍රී නිදහසට ප්‍රබල සීමාවක් බව සමහරු ප්‍රකාශ කරති. එනයින් බලන කල "මනමේ", "සිංහබාහු", "පේමතෝ ජායතී සෝකෝ" මෙන් ම "ලෝමහංස" ද ශෝකාන්ත නාට්‍ය වර්ගයට අයත් වන අතර එක් එක් නාට්‍යය ගත් කල, ඒවායේ ඇති ඛේදනීයත්වය නැතහොත් අපේක්ෂා භංගත්වය හා මානව සබඳතා අභිබවා යන සනාතන අර්බුදයන් ද ප්‍රතිනිර්මාණය කර ඇත.

1) සිංහල බෞද්ධ සාහිත්‍යයේ එන අග්‍රගණ්‍ය ම ප්‍රේමකතාව කුමක් ද?

2) "පේමතෝ ජායතී සෝකෝ" නාට්‍යය රචනා කිරීමේ අරමුණ කුමක් ද?

3) ශෛලිගත සම්ප්‍රදායේ දක්නට ලැබෙන ලක්ෂණයක් මෙහි දැක් වේ. එය කුමක් ද?

4) "මනමේ", "සිංහබාහු", "ලෝමහංස" යන නාට්‍ය කවර නාට්‍ය වර්ගයට අයත් ද?

5) පහත පදවල අර්ථය ලියන්න.
   අ) අපේක්ෂාභංගත්වය -
   ආ) අභිබවා -

(ලකුණු 2 x 5 = 10යි)

05. සරුබිම, සුපිපි විද්‍යාලයේ විදුහල්පතිවරයෙකු ලෙස සේවය කර විශ්‍රාම ලද දසනායක බණ්ඩාර මහතා ලියූ "විදු බිම සිත් සවිය" පද්‍ය නිර්මාණ සංග්‍රහය දොරට වැඩීමේ උලෙළ, වත්මන් විදුහල්පතිනිය වන "දුමුතු විද්‍යා" මහත්මියගේ ප්‍රධානත්වයෙන් ද ආදි ශිෂ්‍ය කලා සංගමයේ මෙහෙයවීමෙන් ද 2025. 08. 28 වන දින පාසල් ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට නියමිත ය. කලාකීර්ති, කවිපති, නීතිඥ විජේසිරි උක්වත්ත මහතාගේ දේශනයක් ද එදින පැවැත්වේ. එම උත්සවය සඳහා සුදුසු න්‍යාය පත්‍රය සකස් කරන්න.

නැතහොත්

කුණු කසළ බැහැර කිරීමේ අවධිමත් ක්‍රියා පටිපාටිය මත ඩෙංගු රෝගය තදින් ම පැතිර යාම බස්නාහිර පළාතෙන් වාර්තා වේ. මෙහි දී වැඩි ම රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වූයේ ඔබ ප්‍රදේශය වන මාඉබුල ප්‍රදේශයෙන් වන අතර එය මර්දනය කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ගයන් මෙන් ම ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වන්නට අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂවරයාට යැවෙන ලිපිය සකස් කරන්න. ඔබ, ප්‍රදේශයේ ප්‍රජාමූල සංගමයේ ලේකම්, සුරංග රත්නායක යැයි සිතන්න.

(ලකුණු 15යි)



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

# කලාප අධ්‍යාපන කාර්යාලය කොළඹ - ශ්‍රී ජයවර්ධනපුර
# வலயக் கல்வி காரியாலயம் கொழும்பு - ஸ்ரீ ஜயவர்தனபுரம்
# Zonal Education Office Colombo - Sri Jayawardhanapura

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2025**
**Second Term Test - 2025**

**සිංහල භාෂාව හා සාහිත්‍යය III** | **11 ශ්‍රේණිය** | **කාලය පැය දෙකයි**

නම.............................................................................

- දී ඇති උපදෙස් පරිදි ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 යන ප්‍රශ්නවලටත් 5, 6, 7 යන ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80කි.

01. අංක i සිට x තෙක් සියලු අනුකොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. "දේවයන් වහන්ස, බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එක් සියයක් රජ දරුවන් හා ඒ සා මහත් චතුරංගනී සේනාවක් ගෙනවුත් වේදේහ රජු අල්ලා ගත නො හී පැරැද පලා ගියහ.'යි අපට මහත් ලජ්ජා වන්නී ය."

අ) ඉහත ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් ද?
ආ) ඉහත ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථය රචනා කිරීම සඳහා මූලාශ්‍ර කර ගත් ග්‍රන්ථය කුමක් ද?

ii. සදා කුලය නොහැර ම එන අසුබ ව
එදා ගියේ රිළවුන් සන්සල බව

අ) ඉහත පද්‍ය පාද දෙක ඇතුළත් ග්‍රන්ථය රචනා කළේ කවුරුන් ද?
ආ) රිළවුන්ගේ සන්සල බව නැති වීමට හේතුව ලියන්න.

iii. "දිවිහිමියෙන් මා ඒ වේදනාවෙන් පෙළෙන බව දනිමි."

අ) මෙහි සඳහන් ආකාරයට වේදනාවෙන් පෙළෙන අය කවුරුන් ද?
ආ) ඉහත ප්‍රකාශය ඇතුළත් නිර්මාණයෙහි නිර්මාණකරු කවුරුන් ද?

iv. "උඹ දැන් ඉක්මන් කරලා ගමට යන එකයි වඩා හොඳ."

අ) ඉහත ප්‍රකාශයෙහි "උඹ" යනුවෙන් ඇමතුම් ලබන්නේ කවුරුන් ද?
ආ) එම ප්‍රකාශය ඇතුළත් කතාවේ අනුවර්තකයා විසින් පරිවර්තනය කරන ලද වෙනත් ග්‍රන්ථයක් ලියන්න.

v. දිමුත් වෙහෙර වට විසිතුරු මල්වතු ය
එහිත් සුවඳ මල් නිති වෙයි <u>මීණිමුතු</u> ය
<u>මහත් තුරු</u> මියුරු පල ගෙන නැමී අතු ය
රැගත් සෙවණ නොහැර ම සිටී පොල් වතු ය

අ) ඉහත පද්‍යයෙහි සඳහන් වෙහෙර පිහිටි ගම් පියස ලියන්න.
ආ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

vi. "එසේ වී නම් මම උන් හා එක් වෙමි."

අ) ඉහත ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් ද?
ආ) එම ප්‍රකාශය සඳහන් පාඩම ඇතුළත් ග්‍රන්ථය රචනා කළ අවධිය ලියන්න.

vii. අ) එස්. මහින්ද හිමියන් විසින් රචනා කරන ලද දේශාභිමානී කාව්‍ය නිර්මාණයක් ලියන්න.
ආ) එම කතු හිමියන් ලියූ මුල් ම කාව්‍ය කෘතියේ නම ලියන්න.



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

viii. "හෙ අනෙකෙක් නොවෙයි, තී පිත් අහිංසක කුමාර යැ."
අ) ඉහත ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් ද?
ආ) එම ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය සඳහා පාදක කොට ගත් බුදු ගුණය ලියන්න.

ix. අ) සිංහල සාහිත්‍ය වංශයේ දැනට ඇති පැරණිතම සන්දේශ කාව්‍යය කුමක් ද?
ආ) සැළලිහිණි සන්දේශය රචනා වූ අවධිය ලියන්න.

x. එල්ල වෙන්ට කවි කර කීවෙමි බොහොම
කොල්ල කන්ට එති සිවුපාවෝ බොහොම
ගොල්ල සමග එති ඌරෝ සැමදාම
නිල්ල අඹති සත් දවසින් බැලුවාම

අ) සත් දවසින් නිල්ල අඹන්නේ මොනවා ද?
ආ) ඉහත කවිය අයත් කවි වර්ගය ලියන්න.

(ලකුණු 2 x 10 = 20යි)

02. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i. "එහෙයින් නුවණැත්තවුන් විසින් නිෂ්ප්‍රයෝජන වූ කෙළිලළු ආදියෙහි ඇලුම් හැර, නිවනෙහි ම ඇල්ම කොට, තුන් දුසිරින් දුරු ව, තුන් සුසිරි පුරා, මතු මතුයෙහි ලැබිය යුතු ලොව් ලොව්තුරා ගුණ විශේෂයට පිහිට විය යුතු."
අ) අංකිත පදවල අර්ථ ලියන්න.
ආ) ඒ හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

ii. නොයෙක් තැන ම පිපි මල් පිරුණු පොකුණු ය
ගෙයක් කන ම සැදැහෙන් දෙවන දකුණු ය
සුදක් ලෙස තිබෙයි මළු මං හැර කුණු ය
..............................................................................
අ) ඉහත පද්‍යයේ සිව් වන පද්‍ය පාදය ලියන්න.
ආ) අංකිත පදවල අර්ථ ලියන්න.

iii) "මා බඳු පණ්ඩිත කෙනෙකුන් ජීවත් වැ හින්ද දී ම මෙතෙක් රජ දරුවන් මිය යාම යුක්ත නොවන්නේ ය. උනට මා පිටිවහල් වුව මැනවැ..."
අ) මෙසේ සිතුවේ කවුරුන් ද?
ආ) එසේ සිතීමට හේතු වූ කරුණු ලියන්න.

iv. "මෙසේ හට ගත් බිය සැක සිතින් පහ කරමින
තොසේ වෙමින් ඒ මිහිඳා වෙසෙන සඳ පෙමින
බසේ මුවින් පිට වුණ නිසා වැඩුණු කුහුලින
විසේසය පියාගේ දකිති දරුවෝ දින දින"
අ) දරුවන් දකින පියාගේ විසේසය කුමක් ද?
ආ) ඉහත පද්‍යයේ අදහස කෙටියෙන් පැහැදිලි කරන්න.

v. මී අඹ- කිරල- මාදම් ගෙඩි ළදරු වියේ
ඇකයේ හෙළා හඬවයි සැඩ සුළඟ රැයේ
සුළි මැද කැරකෙමින් ඉඳුනිල් ගැඹුරු දියේ
සමහර තැනක ලස්සන මල් තැකුළු තියේ

අ) ඉහත පද්‍යය ඇතුළත් පද්‍ය පන්තිය රචනා කළ රචකයාගේ වෙනත් කෘතියක් ලියන්න.
ආ) ඉහත කවියෙහි තෙවන හා සිව් වන පද්‍ය පාදවලින් අදහස් වන දේ කෙටියෙන් ලියන්න.

(ලකුණු 2 x 10 = 20යි)


SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

03. පුද්ගලයාගේ සමාජ හැසිරීම් කෙරෙහි,

අ) අයහපත් උපදේශකත්වය අයහපත ගෙනෙන ආකාරයත්

ආ) යහපත් උපදේශකත්වය යහපත ගෙනෙන ආකාරයත්

අහුල්මල් දමනය කතාවෙන් නිරූපණය වේ. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

අ) සමාජ හා සංස්කෘතික තොරතුරු ඉදිරිපත් කිරීමත්

ආ) එවක දේශපාලනික තොරතුරු නිරූපණයත්

සැළලිහිණි සන්දේශයෙන් දැක්වෙන අයුරු එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

04. අ) මවකගේ දාරක ස්නේහය දැක්වීමත්

ආ) පියෙකුගේ දාරක ස්නේහය දැක්වීමත්

යන දෙක ම සාර්ථක ව ඉදිරිපත් කිරීමට සිංහබාහු නාට්‍යයේ ඔබට නියමිත කොටස සමත් වූ ආකාරය එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

අ) දරිද්‍රතාවෙන් පෙළෙන ගැමියන්ගේ ස්වභාවයත්

ආ) පරිසරය ජය ගැනීමට නොහැකි කටුක පාරිසරික තත්ත්වයන් නිරූපණයත්

බැද්දේගමෙහි නිර්මිත අයුරු උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

5, 6, 7 යන ප්‍රශ්නවලින් එකකට පිළිතුරු ලියන්න.

5. "මහෞෂධ පඬිතුමාගේ සාර්ථකත්වය ඔහු තුළ තිබූ පෙර සූදානම හා දූරදර්ශීබව නිසා ඇති වූවකි." මෙම කියමන නිදසුන් තුනක්වත් දක්වමින් විමසන්න.

6. කුරක්කන් වගාවේ ආරම්භයේ සිට ම වගාවේ ස්වරූපය දැක්වීමට ජන කවියා සමත් වූ ආකාරය "කුරහන් ඉසිමුව කළුවර බලාලා" පද්‍ය පන්තිය ඇසුරින් උදාහරණ තුනක් දක්වමින් විමසන්න.

7. විමර්ශනයෙන් තොර තීරණ ගැනීම පසුතැවීමට හා දුකට හේතු වන අයුරු උග්ගසේන කතා වස්තුවේ උග්ගසේන සිටු පුත්‍රයාගේ චරිතය ඇසුරින් නිදසුන් තුනක්වත් දෙමින් විමසන්න.

(ලකුණු 10 යි)



SLGURU.LK
Education Purpose Only